ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3331- මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.05.24 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට සහ 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I කොටස

01. පෙර පාසල් හෝ ප්‍රාථමික අධ්‍යාපන පසුබිම තුළ "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

02. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳ රූසෝ විසින් හඳුන්වා දුන් දාර්ශනික අදහස් පහක් (05) ලැයිස්තුගත කරන්න.

03. "ප්‍රාථමික පන්ති කාමරයක් තුළ ක්‍රියාකාරකම් පාදක ඉගෙනීම වඩාත් ඵලදායී ඉගෙනුම් ක්‍රමයකි." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබගේ පිළිතුර කරුණු පහක් (05) යටතේ සාධාරණීකරණය කරන්න.

04. ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමයේ ඇතුළත් නිපුණතා හත (07) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ 1972 දී හඳුන්වා දුන් ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු පහක් (05) ලැයිස්තුගත කරන්න.

06. "සැමට අධ්‍යාපනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

07. මාරියා මොන්ටිසෝරි ක්‍රමයේ මූලධර්ම තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

08. පවුල යන සංකල්පය සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. ලකුණු 05 X 08 =40

## II කොටස

09. I. විස්තෘත පවුල් සහ න්‍යෂ්ටික පවුල්වල මූලික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 )

II. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පවුල් ව්‍යුහය වෙනස් කිරීමට සමාජ-ආර්ථික සාධක බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07 )

III. ශ්‍රී ලාංකිය සමාජය තුළ, න්‍යෂ්ටික පවුල් වල දෙමව්පියෝ ගැටලු රාශියකට මුහුණ දෙති." ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? ඔබගේ පිළිතුර කරුණු හතරක් (04) යටතේ සාධාරණීකරණය කරන්න. (ලකුණු 07 )

10. I. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධ ගැටළු **පහක් (05)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 )

II. ඔබගේ අවබෝධයට අනුව ශ්‍රී ලංකාව තුළ එම ගැටලු අවම කිරීම සඳහා කුමන ආකාරයේ විසඳුමක් හඳුන්වා දීමට ඔබ කැමතිද? (ලකුණු 07 )

III. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා වත්මන් රජය විසින් හඳුන්වා දිය යුතු නව උපාය මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. 1999 දී ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයේ හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ලක්ෂණ පහත තේමාවන්ට අනුකූලව විස්තර කරන්න.

I. විෂය මාලාව (ලකුණු 06)

II. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද (ලකුණු 06)

III. සිසුන් තක්සේරු කිරීම (ලකුණු 08)

12. I. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි තුන (03) සඳහන් කරන්න. (ලකුණු 03 )

II. එම එක් එක් ප්‍රධාන අවධිවල සුවිශේෂී වෙනස්කම් උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 09 )

III. ඔබගේ අවබෝධයට අනුව, ඉහත සඳහන් කළ ප්‍රධාන අවධි හඳුන්වා දීමෙන් පසු ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් ගුරුවරුන් ඵලදායී ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වෙන්නේද? සාධක හතරක් (04) සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08 )

13. පහත සඳහන් ඕනෑම දෙකක් **(02)** ගැන කෙටි සටහන් ලියන්න.

I. ප්‍රාථමික පන්ති කාමරයේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන්.

II. ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රධාන ප්‍රමිතීන්.

III. ළමයින්ගේ ප්‍රධාන සමාජ- චිත්තවේගීය සංවර්ධනය.

IV. ළමයින්ගේ කායික සංවර්ධනය.

(ලකුණු 10 X 02 =20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*